අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/21/08/01/2021

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2021/03/17

**චක්‍රලේඛ අංක : 04/2021**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පරිවේණාධිපතිවරුන්,
සියලුම රජයේ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම උපකෘත විශේෂ පාසල්වල විදුහල්පතිවරුන්,
සියලුම ජාත්‍යන්තර පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය - 2020/2021

ඉහත කරුණට අදාළව අධ්‍යාපන අමාත්‍යාංශයේ අංක 24/2019 හා 2019.04.11 දිනැති චක්‍රලේඛය මෙයින් අවලංගු කෙරේ. මෙම චක්‍රලේඛය 2020 දෙසැම්බර් 02 දින සිට ක්‍රියාත්මක වේ.

"සදා සුරකිමු- දැයේ දරුවන්" තේමාව තුළ ක්‍රියාත්මක කෙරෙන "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය දරුවන්ගේ සුරක්ෂිතතාව තහවුරු කිරීමට 2017 වර්ෂය සඳහා වූ අයවැය යෝජනාවක් මත රජය විසින් හඳුන්වා දුන් වැඩසටහන තවදුරටත් ක්‍රියාත්මක කෙරේ.

දැනුමින් හා කුසලතාවලින් පරිපූර්ණ වූ දරුවන් සමාජ ගත කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයේ මුඛ්‍ය පරමාර්ථය වන අතර සෑම වයස් කාණ්ඩයකදී ම ඒ සඳහා ආරක්ෂිත පරිසරයක් පැවතීම අත්‍යවශ්‍ය සාධකයකි. එබැවින් කායික හා මනෝ සමාජයීය යහපැවැත්ම තහවුරු කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය, කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සමඟ එක්ව පියවර ගෙන ඇති අතර පාසල තුළ දී හා ඉන් පිටත දී ඇතිවන රෝග, අනතුරු හා ආබාධ සඳහා ආරක්ෂාව තහවුරු කිරීමේ පියවරක් ලෙස සෞඛ්‍ය රක්ෂණාවරණය ක්‍රියාත්මක වේ.

රෝග, අනතුරු හා ආබාධ තත්ත්වවල දී ඉක්මන් සෞඛ්‍ය සේවා සඳහා යොමු කරමින් ඉක්මන් සුවය තුළින් පාසල් පැමිණීම වැඩි කිරීම, ආබාධ තත්ත්වවල දී අවශ්‍ය ප්‍රතිකාර සඳහා යොමු වීමට සහාය වීම යන අරමුණු මත "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය හඳුන්වා දී ඇති අතර, එ මඟින් සියලු ම ශ්‍රී ලාංකික පාසල් සිසුන් ආවරණය කෙරේ. එනම් සියලු ම රජයේ පාසල්, ආධාර ලබන හෝ නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, උපකෘත පාසල්, සහ ජාත්‍යන්තර පාසල් යන විධිමත් සාමාන්‍ය අධ්‍යාපන ආයතනවල ලියාපදිංචි වී අධ්‍යාපන කාර්යයේ නිරතවන 1ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා ශ්‍රේණිවල ද, විශේෂ අධ්‍යාපන ඒකකවල ද ඉගෙනුම ලබන වයස අවුරුදු 5ත් 21ත් අතර වයස් සීමාවේ පසු වන සියලුම ශ්‍රී ලාංකික සිසුහු ප්‍රතිලාභීහු වෙති.

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂිකව ගිවිසුම් ගත වන රක්ෂණ ආයතනය මඟින් වර්ෂයක කාලයක් සඳහා රක්ෂණාවරණය සැපයේ. ඒ අනුව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල්

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සමග ගිවිසුම් ගත "ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව" විසින් 2020 දෙසැම්බර් 02 දින සිට 2021 දෙසැම්බර් 01 දින දක්වා වන වර්ෂයේ පැය 24 ම ආවරණය වන පරිදි දින 365ක කාලයක් සඳහා රක්ෂණාවරණය සැපයේ.

රක්ෂණාවරණ පහසුකම් අංශ තුනකින් සමන්විත වේ. ඒවා 1, 2, සහ 3 ලෙස දැක්වේ.

1. සෞඛ්‍ය රක්ෂණාවරණ

    1.1 නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ-රු 200,000 /= (රජයේ/පුද්ගලික)

    1.2 බාහිර ප්‍රතිකාර ප්‍රතිලාභ-රු. 10,000 /= (උපදෙස් සංග්‍රහයේ දෙවන පරිච්ඡේදයේ සඳහන් ප්‍රතිලාභ)

    1.3 අසාධ්‍ය රෝග ප්‍රතිලාභ- රු. 200,000/= සිට රු.1,500,000/= දක්වා

2. අනතුරු රක්ෂණාවරණ

    2.1 පූර්ණ සදාකාලික අකර්මන්‍යතා සඳහා - රු.200,000/=

    2.2 සදාකාලික අර්ධ අකර්මන්‍යතා සඳහා - රු.150,000/= - රු. 200,000/= දක්වා

    2.3 තාවකාලික අකර්මන්‍යතා සඳහා - රු. 25,000 /=සිට රු.100,000/= දක්වා

3. ජීවිත රක්ෂණාවරණ

    3.1 දෙමාපිය වියෝවකදී එක් අයෙකු සඳහා රු.200,000/= (අඩු අදායම්ලාභී පවුල්වල සිසුන්ට පමණි)

        a. මාපියන් දෙදෙනා ආවරණය වන පරිදි ප්‍රතිලාභ හිමිවේ.

        b. පවුලේ සියලු පාසල්යන ළමුන්ට ප්‍රතිලාභ හිමිවන නමුත් එක් සිද්ධියක් වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම මුදල රු.600,000/= කි.

ඉහත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා "සුරක්ෂා" සිසු රක්ෂණාවරණයේ ප්‍රතිලාභියකු බව තහවුරු කළ යුතුය. ඒ සඳහා හිමිකම් ඉල්ලුම් පත්‍රයේ විදුහල්පති විසින් අත්සන තබා සහතික කිරීම අනිවාර්යය වේ.

මෙම රක්ෂණාවරණ සීමා, කොන්දේසි, ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු ස්ථාන, රක්ෂණාවරණ නොලබන අවස්ථා පිළිබඳ විස්තර උපදෙස් මාලාව තුළ අන්තර්ගත කෙරේ.

සිසුන්ට රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා දීමේ දී අධ්‍යාපන නිලධාරීන්ගෙන් සහ පාසල් ප්‍රධානීන්ගෙන් පහත සඳහන් කාර්යය ඉටු විය යුතු ය.

- පළාත් අධ්‍යාපන ලේකම්ගේ ප්‍රධානත්වයෙන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව මඟින් අවශ්‍ය සොයා බැලීම් හා මැදිහත් වීම් සිදු කිරීම.
- පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ද, අධ්‍යාපන කලාප කාර්යාලයයේ ද, පාසලේ ද මෙම කාර්යය භාරව නිලධාරියකු/ගුරුභවතකු පත් කිරීම.
- තම පාසලේ ඉගෙනුම ලබන සිසුන් පිළිබඳ තොරතුරු නිසි පරිදි සැපයීම.
- රක්ෂණ ප්‍රතිලාභ ලබා ගැනීමේ දී තොරතුරු සහතික කිරීම.

- ප්‍රතිලාභ ලබාගන්නා වූ සිසුන් පිළිබඳ තොරතුරු ගොනුවක් (භෞතික හෝ පරිගණක ගත) පාසලේ පවත්වා ගැනීම හා අවශ්‍ය ආයතන වෙත තොරතුරු ලබා දීම.
- පාසල් විසින් නව සිසුන් ඇතුළත් වීමේ දී එම තොරතුරු නොපමා ව අදාළ අංශ වෙත වාර්තා කිරීම.
- පාසල් අධ්‍යාපනයෙන් සිසුන් ඉවත් වන ඕනෑ ම අවස්ථාවක දී එම සිසු තොරතුරු නොපමාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හෝ එහි ශාඛාවකට ලිඛිත ව දැනුම් දීම.
- රක්ෂණ ප්‍රතිලාභ පිළිබඳ සියලු තොරතුරු අඛණ්ඩ ව සිසුන්, දෙමාපියන් සහ පාසල් ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රතිලාභ ලබා ගැනීම සම්බන්ධ ගැටලු ඇති වන අවස්ථාවල දී මැදිහත්කරුවකු ලෙස ක්‍රියා කිරීම.
- සිසු රක්ෂණාවරණ ප්‍රතිලාභ ලබා ගැනීමට අවකාශ සැලසීම.

එක් එක් අධ්‍යාපන ආයතන සතු කාර්යභාරය උපදෙස් මාලාව තුළ අන්තර්ගත කෙරේ.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් හඳුන්වා දෙනු ලබන "සුරක්ෂා" රක්ෂණාවරණයට අදාළ ප්‍රතිලාභ, කොන්දේසි හා අපේක්ෂිත කාර්යභාරය පිළිබඳ නිසි පරිදි ප්‍රජාව දැනුවත් කිරීමට අධ්‍යාපන බලධාරීන් කටයුතු කළ යුතුය.

නීරෝගී දරු පරපුරක් දැයට දායාද කිරීම හා ලැබී ඇති අධ්‍යාපනික අවස්ථාවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට ඉඩකඩ සැලසීම හා සිසු රක්ෂණාවරණයේ උපරිම ප්‍රතිලාභ සිසුන්ට හිමිකර දීම සඳහා කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

1. ජනාධිපති ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
2. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැනගැනීම සඳහා
3. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම සඳහා
4. ලේකම් - මුදල් අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
5. ලේකම් - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
6. ලේකම් - කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම සඳහා
7. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම සඳහා

# උපදෙස් මාලාව

## 1 වන පරිච්ඡේදය - සුරක්ෂා සිසු රක්ෂණාවරණය

රක්ෂණාවරණය, රක්ෂණ ආයතනය, ප්‍රතිලාභීන්, ප්‍රතිලාභියකු බවට පත් වීම පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 1.1. රක්ෂණාවරණය

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් හඳුන්වා දෙනු ලබන රක්ෂණාවරණය "සුරක්ෂා" සිසු රක්ෂණාවරණය ලෙස හැඳින්වේ.

### 1.2. රක්ෂණ ආයතනය

කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ගිවිසුම් ගත වන ආයතනය සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වන අතර 2020 දෙසැම්බර් 02 දින සිට 2021 දෙසැම්බර් 01 වෙනි දින දක්වා කාලයේ රක්ෂණාවරණය කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය සමඟ ගිවිසුම් ගත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් සැපයේ.

### 1.3. ප්‍රතිලාභීන්

රජයේ පාසල්, ආධාර ලබන පෞද්ගලික පාසල්, ආධාර නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, උපකෘත පාසල් සහ ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන අවුරුදු 5-21 වයස් සීමාවේ පසු වන සියලු ම ගිහි-පැවිදි ශ්‍රී ලාංකික සිසුහු ප්‍රතිලාභීහු වෙති.

මෙම චක්‍රලේඛයේ සහ උපදෙස් සංග්‍රහයෙහි රජයේ පාසල්, ආධාර ලබන පෞද්ගලික පාසල්, ආධාර නොලබන පෞද්ගලික පාසල්, උපකෘත පාසල්, ජාත්‍යන්තර පාසල් **"පාසල්"** යන්නෙන් අරුත් ගැන්වෙන අතර මූලික පිරිවෙන්, මහ පිරිවෙන් සහ විද්‍යායතන **"පිරිවෙන්"**යන්නෙන් අරුත් ගැන්වේ. ගිහි-පැවිදි ශිෂ්‍ය-ශිෂ්‍යාවන් **"සිසුන්"** යන්නෙන් අරුත් ගැන්වේ.

### 1.4. ප්‍රතිලාභියකු බවට පත්වීම

රක්ෂණ කාල සීමාව තුළ රජයේ පාසල්, ආධාර ලබන පෞද්ගලික පාසල්, ආධාර නොලබන පෞද්ගලික පාසල්, පිරිවෙන්, උපකෘත පාසල්, ජාත්‍යන්තර පාසල්වල ඉගෙනුම ලබන අවුරුදු 5-21 අතර වයස් සීමාවේ සිටින සියලුම සිසුන් ප්‍රතිලාභීන් වන අතර පාසලේ ඇතුළත් කිරීමේ ලේඛනය තුළ ලේඛන ගත ව නියමිත වයස් සීමාවට අයත් සිසුහු ප්‍රතිලාභීන් බවට පත් වෙති. පාසලෙන් ඉවත් වන සිසුහු ප්‍රතිලාභීන් ලෙස ගණන් නො ගැනෙති.

## 1.5 ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ තොරතුරු ලබාදීම

- පරිවේනාධිපති/ පෞද්ගලික පාසල්/ ජාත්‍යන්තර පාසල් විදුහල්පති විසින් තම පිරිවෙනෙහි/ පෞද්ගලික පාසලේ/ ජාත්‍යන්තර පාසලේ වර්තමානයේ ඉගෙනුම ලබන සිසුන් පිළිබඳ තොරතුරු ඇමුණුම 01ට අනුකූල ව නිසි පරිදි පරිගණක ගත කොට දෘඩ පිටපත හා මෘදු පිටපත විද්‍යුත් තැපැල (**suraksha.shnb@moe.gov.lk**) මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව වෙත යොමු කිරීම හා එම තොරතුරු අවශ්‍ය පරිදි අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ලබා දීම.

- රජයේ පාසල් සඳහා ඇමුණුම 01 සඳහන් තොරතුරු මාර්ගගත ශිෂ්‍ය (SIS) තොරතුරු පද්ධතිය මගින් ලබා ගන්නා බැවින් කඩිනමින් තම පාසලේ සිසුන්ගේ තොරතුරු මාර්ගගත ශිෂ්‍ය තොරතුරු පද්ධතියට ඇතුළත් කළ යුතුය.

- පාසලට අලුතින් සිසුන් ඇතුළත් වීමක දී එම සිසු තොරතුරු නොපමාව අධ්‍යාපන අමාත්‍යාංශයට සහ රක්ෂණ ආයතනයට හෝ එහි ශාඛාවකට ලිඛිතව දැනුම් දීමට ක්‍රියා කිරීම, එම සිසුන් පෙර ඉගෙන ගත් පාසල පිළිබඳ තොරතුරු දැනුම් දීම.
- පාසලෙන් සිසුන් ඉවත් වීමකදී ඒ බව ද නොපමාව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත හා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිත ව දැනුම් දීම.

## 2 වන පරිච්ඡේදය - රක්ෂණාවරණ අවස්ථා හා ප්‍රතිලාභ

සෞඛ්‍ය ප්‍රතිලාභ, අනතුරු ප්‍රතිලාභ, මියයාම/වියෝවක දී හිමිවන ප්‍රතිලාභ, විශේෂ ප්‍රතිලාභ අවස්ථාවන් හා මූල්‍ය ප්‍රමාණයන් පිළිබඳ විස්තර මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

## 2.1 සෞඛ්‍ය ප්‍රතිලාභ (වියදම් ප්‍රතිපූරණය කිරීම පමණි)

### 2.1.1 නේවාසික ප්‍රතිකාර ප්‍රතිලාභ – රු. 200,000/=

සියලුම හිමිකම් වර්ෂයට අදාළ හිමිකම් මුදල් ප්‍රමාණයන්ට යටත්ව ගෙවනු ලැබේ.

(රජයේ රෝහලක ගෙවීම් වාට්ටුවක, හා රජයේ අනුමත පුද්ගලික රෝහල් සඳහා)

a. නේවාසික ප්‍රතිකාර සහ ඖෂධ වියදම ( රජයේ රෝහලක ගෙවීම් වාට්ටුවක, පුද්ගලික රෝහලක, පුද්ගලික ආයුර්වේද රෝහලක - දිනකට උපරිම කාමර ගාස්තුව රු.12,500/-)
b. වෛද්‍ය ගාස්තු/ විශේෂඥ වෛද්‍ය ගාස්තු/ ශල්‍ය වෛද්‍ය හා නිර්වින්දන වෛද්‍ය ගාස්තු
c. ශල්‍ය කර්ම වියදම්, වෛද්‍ය පරීක්ෂණ, ඖෂධ සහ බෙහෙත්, සැත්කම් ගාස්තු පරීක්ෂණ, විශේෂඥ වෛද්‍යවරුන් විසින් නිර්දේශ කරන විශේෂ ප්‍රතිකාර

රජයේ රෝහල් හා නොගෙවන වාට්ටු සඳහා

a. රජයේ රෝහල/ රජයේ ආයුර්වේද රෝහලක නොගෙවන වාට්ටුවක (Non Paying Word ) එක් රාත්‍රියක් සඳහා රු.1000/= දෛනික දීමනාව
රෝහල් ගතවීමකින් තොරව සිදු කරනු ලබන ශල්‍ය කර්ම සඳහා වන වියදම් ( ලැයිස්තුව අමුණා ඇත.)

b. ආසාධ්‍ය හෝ බරපතල රෝග සඳහා නිර්දේශිත විශේෂ පෝෂණ අතිරේක සඳහා වන වියදම් රෝහලින් නිදහස්වූ පසු ඖෂධ සඳහා සතියක කාලයක් වෙනුවෙන් (නිදහස් වූ දිනයේ සිට) ගෙවනු ලැබේ

**අඩු අදායම්ලාභීන්හට පමණක් පහත අයිතමයන් සඳහා වන ප්‍රතිලාභ ද හිමිවේ.**

a. වෛද්‍ය නිර්දේශ මත විදේශයකදී සිදු කරන ප්‍රතිකාර
b. දිගුකාලීන රෝග/ශල්‍ය කර්ම/අනතුරුවලදී භාවිත කිරීමට සිදුවන උපකරණ සහ ද්‍රව්‍ය සඳහා වන වියදම (TED/ Stockings/ air mattress/ water mattress/ rehabilitation accessories/ special shoes/ walking aids/ crutches etc.)
c. හදිසි අනතුරකින් පසු හෝ හදිසි අනතුරකින් ඇතිවන කැළැල් මත සිදු කරනු ලබන ප්ලාස්ටික් සැත්කම් සඳහා යන වියදම

## 2.1.2 බාහිර ප්‍රතිකාර - රු. 10,000/=

**ප්‍රතිපූරණය කිරීම පමණි**

a. රෝහල් ගතවීමකින් තොරව වුවද පහත පරීක්ෂණ සඳහා වියදම් ප්‍රතිපූරණය කෙරේ. (EEG, MRI, CT Scan, DMSA Scan, DTPA Scan, Ultra Sound Scan)
b. දන්තාබාධ සඳහා ප්‍රතිකාර - දත් ගැලවීම හා පිරවීම පමණි.
c. හදිසි අනතුරක් හේතුවෙන් සිදුවන රෝග තත්ත්වයන් සඳහා ආයුර්වේද ප්‍රතිකාර ලබා ගැනීම (රජයේ අනුමත ආයුර්වේද වෛද්‍යශාලා )

පහත ප්‍රතිලාභ ලබා ගත හැකි වන්නේ වෛද්‍ය නිලධාරිවරයෙක් හෝ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හෝ අක්ෂි ශල්‍ය වෛද්‍ය වරයෙකුගේ නිර්දේශය මත පමණි( **මෙය ප්‍රතිපූරණය කිරීමේ පදනම මත ලබා ගත හැකි ප්‍රතිලාභයකි. ඒසේ වුවද අඩු ආදායම්ලාභීන් සඳහා මෙම පහසුකම සෘජු ගෙවීමේ ක්‍රමය යටතේ ලබා ගත හැකිය)**

a. අක්ෂි,කර්ණ, ශ්‍රවන ආබාධ සඳහා ප්‍රතිකාර
b. අක්ෂි, කර්ණ හා ශ්‍රවණ ආබාධ සඳහා නිවැරදි කිරීමේ උපකරණ ලබා ගැනීම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිර්දේශය හෝ අක්ෂි ශල්‍ය වෛද්‍ය අනුමැතිය අවශ්‍ය වේ. (උදා - ඇස් කණ්නාඩි ලබා ගැනීම, ශ්‍රවන උපකරණ ලබාගැනීම)

## 2.1.3 අසාධ්‍ය රෝග ආවරණය - රු. 1,500,000/= දක්වා

දේශීය රෝහලකින් ප්‍රතිකාර සිදු කර ගනු ලබන විට බිල්පත් ප්‍රතිපූරණය කිරීම හෝ සෘජු ගෙවීම් සිදු කරනු ලබන අතර විදේශ රෝහල් ප්‍රතිකාරවල දී ප්‍රතිපූරණය පමණක් සිදු කෙරේ. ප්‍රතිකාර සඳහා විදේශගත විය හැක්කේ ශ්‍රී ලංකාව තුළ අදාළ ප්‍රතිකාර නොමැතිවීම සහ කඩිනම් ප්‍රතිකාර අවශ්‍ය නමුත් පොරොත්තු ලේඛණවල රැඳී සිටීමට සිදුවන අවස්ථාවල දී පමණි. (අසාධ්‍ය රෝග සඳහා සෘජු ගෙවීම් ලබාගත හැකි අනුමත රෝහල් ලේඛණය ඇමුණුම 02 මගින් දක්වා ඇත.)

**අසාධ්‍ය/බරපතල රෝග ආවරණ අවස්ථාවන් පහත දැක්වේ.**

- හදවත් සැත්කම් (Heart surgery)
- පිළිකා ප්‍රතිකාර (Cancer Treatments)
- වකුගඩු බද්ධ කිරීමේ සැත්කම(Kidney transplantation)
- රුධිර කාන්දුකරණය (Dialysis)
- උකුල්, උරහිස් හා දණහිස් අස්ථි ප්‍රතිෂ්ඨාපනය (Hip, Shoulder, Knee Replacements)
- මොළයේ සැත්කම්(Brain Surgery)
- කොඳුඇට පෙළ විකෘතිවීම නිවැරදි කිරීමේ සැත්කම (Scoliosis)
- කර්ණසංඛ බද්ධ කිරීමේ සැත්කම් (Cochlear Implantation)
- කොඳු ඇට පෙළ තෙරපුම සඳහා වූ සැත්කම (Spinal cord Compression)
- අක්මාව බද්ධ කිරීමේ සැත්කම් (Liver Transplantation)
- අක්ෂි සැත්කම් (Eye Surgery) (හදිසි අනතුරු හේතුවෙන් සැත්කම්, කණිනිකා සැත්කම්, අක්ෂි කාච බද්ධ කිරීම)
- කෘත්‍රිම අත්/ පාද උපකරණ මිලදී ගැනීම (Artificial limbs)
- ඇටමිදුලු බද්ධ කිරීමේ සැත්කම් (Bone Marrow transplantation)
- තැලසීමියා (Thalassemia)

## 2.2 හදිසි අනතුරු ප්‍රතිලාභ - ප්‍රතිපූරණය කිරීම යටතේ ( Re-Imbursment Basis)

**පූර්ණ හා සදාකාලික අකර්මන්‍යතා ප්‍රතිලාභය -** (ඒක් අවස්ථාවක හෝ ඒක් වර්ෂයක් සඳහා උපරිම මුදල)

2.2.1 පූර්ණ සදාකාලික අකර්මන්‍යතා සඳහා - රු. 200,000/=

- ඇස් දෙකෙහිම පෙනීම අහිමිවීම රු. 200,000/=
- කන් දෙකෙහිම ඇසීම අහිමිවීම රු. 200,000/=
- ගාත්‍ර දෙකක් අහිමි වීම රු.200,000/=
- එක් ඇසක හා එක් ගාත්‍රයක් අහිමිවීම රු.200,000/=
- එක් කණක් හා එක් ගාත්‍රයක් අහිමිවීම රු.200,000/=
- එක් ඇසක හා එක් කණක් අහිමිවීම රු. 200,000/=

2.2.2 සදාකාලික අර්ධ අකර්මන්‍යතා සඳහා රු.150,000/= සිට රු. 200,000/=

- එක් ඇසක අහිමිවීම රු. 150,000/=
- එක් ගාත්‍රයක් අහිමිවීම රු.150,000/=
- එක් කණක් අහිමිවීම රු.150,000/=

2.2.3 තාවකාලික අකර්මණ්‍යතාව සඳහා රු. 25,000/= සිට රු. 100,000/=

නිවසේ රැඳී සිටිමින් ප්‍රතිකාර ලබා ගැනීමට සිදුවන කාලය අනුව ගෙවීම් තීරණය වේ. මෙයට අදාළ රජයේ අනුමත වෛද්‍යවරයාගේ (ආයුර්වේද ප්‍රතිකාර ද අයත් වේ). නිර්දේශය සහිතව රක්ෂණ ආයතනය විසින් ඉල්ලුම් කරනු ලබන ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

- සති දෙකේ සිට මාස 01 අතර රු. 25,000/=
- මාස 01 සිට මාස 02 අතර රු. 50,000/=
- මාස 02කට වැඩි රු. 100,000/=

## 2.3 මියයාම

මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම් ලබනුයේ රජයේ නිර්ණායක අනුව අඩු අදායම් සහිත පවුල්වල සිසුන් පමණි. ඒ අනුව,

a) වාර්ෂික ආදායම රු 180,000/= කට වඩා අඩු පවුල්වල සිසුන්. අදායම් තත්ත්වය පිළිබඳ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සනාථ කළ යුතුය.

2.3.1 මාපිය/ නීත්‍යානුකූල භාරකරු වියෝවකදී එක් ශිෂ්‍යයකු සඳහා රු. 200,000 /=

- වර්ෂය තුළ මාපියන් දෙදෙනාටම
- පවුලේ පාසල් සිසුන් සියලු දෙනාට ම ආවරණය පවතී.

එක් සිද්ධියක්/ වියෝවක්/මියයාමක් සඳහා ගෙවනු ලබන උපරිම මුදල රු.600,000/=ක් පමණි. පවුලේ පාසල්යන වයසේ සිසුන් ගණන තිදෙනෙකුට වැඩිවන විට උපරිම මුදල සමසේ පාසල් යන සියලුම සිසුන් අතර බෙදී යන සේ හිමිකම් ලබා දීමට කටයුතු කෙරේ.

මාපිය/භාරකරු වියෝවක දී ගෙවීම් සිදු කරනු ලබන්නේ ශිෂ්‍යයා වෙත පමණි. එය පැවිදි ශිෂ්‍යයකු වන විට දී ගෙවීම් කරනු ලබන්නේ නීත්‍යානුකූල දෙමාපියන්ට පමණි. (ජීවත්ව සිටීනම්) භාරකරුවන් යටතේ සිටින දරුවකු ගෙවීම් කරනු ලබන්නේ භාරකාරීත්වය අධිකරණය මඟින් පවරා තිබේ නම් පමණි. නීත්‍යානුකූල භාරකරු මියයාම වෙනුවෙන් ඉදිරිපත් කරන හිමිකම් අයදුම්පත්‍රය සමග භාරකාරීත්වය පවරා ඇති නීත්‍යානුකූල ලේඛණ ඉදිරිපත් කළ යුතුය.

- ශිෂ්‍යයකුගේ මරණය සඳහා ගෙවීම් සිදු නොකෙරේ.

## 3 වන පරිච්ඡේදය - ප්‍රතිලාභ ලබා ගැනීම

ප්‍රතිලාභ අහිමි වීම, ආවරණය නොවන වියදම්, ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන, රක්ෂණාවරණ ක්‍රියාවලිය තුළින් ප්‍රතිලාභ නොලබන අවස්ථා, බිල්පත් ප්‍රතිපූරණය කිරීම කළ යුතු ආකාරය මෙම පරිච්ඡේදය තුළ විස්තර කෙරේ.

### 3.1 ප්‍රතිලාභ අහිමි වීම -

රජයේ නීති රෙගුලාසි අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී නොමැති රෝහලක හෝ ආරෝග්‍යශාලාවක ප්‍රතිකාර ලබන අය සඳහා මෙම ප්‍රතිලාභය හිමි නොවේ.

### 3.2 ආවරණය නොවන වියදම්

පහත වියදම් ආවරණය නොවන බව විශේෂ අවධානයට ගත යුතු යි.

- ගුවන් ටිකට්පත් (විදේශ ගතවී ප්‍රතිකාර ලබන අවස්ථා වලදී )
- ගුවනේදී සිදුවන හදිසි අනතුරු
- සම්භාහන සඳහා යන වියදම් (SPA)
- රෝගී තත්ත්වයකින් තොරව රෝහල් ගත වීම මත හෝ රෝගී තත්ත්වය හා අදාළ නොවන වියදම්
- හදිසි අනතුරකදී නොවන අවස්ථාවක සිදුකරන සුන්නත් කිරීම ( Circumcsion) සඳහා යන වියදම්
- රෝගය සඳහා වන ප්‍රතිකාරවලට අමතර සිදුකරනු ලබන වියදම්. උදා- දුරකථන බිල්පත් , ආහාර , සේවා ගාස්තු යනාදිය
- නීති විරෝධී ක්‍රියාවල නිරත වීමකින් ඇතිවන අනතුරු/ රෝග හෝ ආබාධ
- හදිසි අනතුරක දී හැර අනෙක් අවස්ථාවල දී සිදු කරනු ලබන ප්ලාස්ටික් සැත්කම්/ රූපලාවන්‍ය
- ප්‍රතිකාර/තරබාරුව නැති කිරීමට ගන්නා ප්‍රතිකාර ආදී පෙනුම වර්ධනය සඳහා ලබා ගන්නා ප්‍රතිකාර
- ගැබ් ගැනීම් හා දරු ප්‍රසූතිය
- හෝමියෝපති ප්‍රතිකාර
- ශරීර අවයව ලබා දීම සඳහා රෝහල් ගත වීම ( Hospitaization for donation Of An Organ)
- සිය කැමැත්තෙන් සිදු කර ගනු ලබන අනතුරු/ආබාධ. උදා: සියදිවි නසා ගැනීම්
- මද්‍යසාර භාවිත කර ඇති අවස්ථා හෝ වෛද්‍යවරයකු විසින් සහතික නො කරන ලද හෝ උපදෙස් ලබා දී නොමැති ප්‍රතිකාර සඳහා
- වෛද්‍ය අනුමැතියකින් තොරව වන රෝහල්ගතවීම් හා රෝහල් ගතවීමට අදාළ නොවන රෝග සඳහා වන වියදම්

- යුද්ධයක දී, විදේශ ආක්‍රමණ, දෙපාර්ශවයන් අතර ඇතිවන ගැටුම් යනා දී අවස්ථාවල දී සිදුවන අනතුරු/ආබාධ
- කළහකාරි ලෙස හැසිරීම්, උද්ඝෝෂණවල නිරතවීම් අවස්ථාවල දී සිදුවන අනතුරු
- අවසරයකින් තොරව සිදු කරනු ලබන ගුවන් ක්‍රියා අත්හදා බැලීම්වල දී සිදුවන අනතුරු/ආබාධ

## 3.3 ප්‍රතිලාභ ලැබීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

රෝහලකින් පිටවූ පසු පහත ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු ය. රෝගියා ගේ අවශ්‍යතා සඳහා ඡායා පිටපත් ලබා ගත යුතු ය. පහත සඳහන් ලිපිලේඛන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට හෝ ළඟ ම ඇති ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ශාඛා කාර්යාලයකට භාර දීම හෝ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අයත් ශාඛා ලේඛනය ඇමුණුම 03 හි දැක්වේ. හිමිකම් පත්‍රය ඇමුණුම 04 හි දැක්වේ.

<table>
<tr><th colspan="2">ප්‍රතිලාභ අවස්ථාව හා ඉදිරිපත් කළ යුතු ලියවිලි</th></tr>
<tr><td colspan="2">• ගෙවීම් කළ බිල්පත් වල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර අනෙකුත් ඕනෑම ලේඛණයක පිටපතක් ඉදිරිපත් කිරීමේ දී එම ලේඛණ විදුහල්පති විසින් හෝ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඕනෑම ශාඛාවක කළමනාකරුවෙකු, පරිපාලන නිලධාරියකු සහතික කර ඉදිරිපත් කළ යුතුය.<br>• අඩු ආදායම්ලාභීන්ට පමණක් හිමි ප්‍රතිලාභ ලබා ගැනීමේ දී ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද අඩු ආදායම්ලාභීන් බව සහතික කරන ලද ග්‍රාම නිලධාරී සහතිකය ඉදිරිපත් කළ යුතුය.<br>• මව /පියා වෙනුවට නීත්‍යානුකූල භාරකරුවකු ඉදිරිපත් වන විට නීත්‍යානුකූල භාරකාරත්වය පවරන ලද අදාළ ලියවිලි තිබිය යුතුය.<br>• ප්‍රතිලාභ ලබා ගැනිමේදී සිද්ධියක් සිදුවූ දින සිට දින 90 ක් තුළ හිමිකම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඒසේ වුවද රක්ෂණාවරණය අවසන් වන 2021.12.01 දින සිට දින 30 ක් ඇතුළත සියලු රක්ෂණ හිමිකම් අයදුම්පත් ඉදිරිපත් කර අවසන් කළ යුතුය.<br>• ඒ අනුව අවසාන මාසයට අදාළ රක්ෂණ හිමිකම්පත් භාර ගන්නා අවසාන දිනය 2021.12.31 දින වේ.</td></tr>
<tr><td>රජයේ රෝහල් ගතවීමක දී</td><td>හිමිකම් පත්‍රය , ඇඳ ඉහ පත්‍රිකාව/රෝග නිශ්චය පත්‍රිකාව, සායන පත, බාහිරෙන් ලබා ගන්නා ඖෂධ හා පරීක්ෂණ සඳහා වෛද්‍යවරයා විසින් අනුමත කළ වට්ටෝරුව(නිල මුද්‍රාව සහිතව),එයට අදාළ ගෙවීම් කළ බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර</td></tr>
</table>

| | |
|---|---|
| පුද්ගලික රෝහල් ගතවීමක දී බිල්පත් ප්‍රතිපූරණය කිරීම පමණි. | හිමිකම් පත්‍රය , රෝග විනිශ්වය පත්‍රිකාව, ගෙවීම් කළ කුවිතාන්සි (අවසන් හා අත්තිකාරම්), විස්තරාත්මක බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| බාහිර ප්‍රතිකාර ( මුල් පිටපත්) | හිමිකම් පත්‍රය, වෛද්‍යවරයාගේ නිල මුද්‍රාව, දිනය, ලිපිනය, දුරකතන අංකය සහිත වට්ටෝරුව, විස්තරාත්මක බිල්පත, ගෙවීම් කළ ලදුපත් වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| දෙමාපිය මරණයක දී | හිමිකම් පත්‍රය , මරණ සහතිකය, මරණ පරීක්ෂණ වාර්තාව (අවශ්‍ය අවස්ථාවල දී), තාවකාලික මරණ සහතිකය, ශිෂ්‍යාගේ උප්පැන්න සහතිකයේ පිටපත, සිසුවාගේ බැංකු ගිණුම් විස්තර, මියගිය තැනැත්තාගේ ජාතික හැදුනුම්පතෙහි පිටපතක්, අඩු ආදායම්ලාභියෙකු බවට ප්‍රාදේශීය ලේකම් අනු අත්සන සහිත ග්‍රාම නිලධාරී සහතිකය |
| පූර්ණ/ අර්ධ/ තාවකාලික අකර්මණ්‍යතාවක දී | හිමිකම් පත්‍රය , රෝග විනිශ්වය කාඩ්පත, වෛද්‍ය සහතිකය හා නිර්දේශ, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර |
| අසාධ්‍ය රෝග ප්‍රතිලාභ ලැබීමක දී<br>-සෘජු ගෙවීමක දී<br><br>-ප්‍රතිපූරණයක දී | හිමිකම් පත්‍රය , විශේෂඥ වෛද්‍ය නිර්දේශ ලිපිය හා වැය ඇස්තමේන්තුව, රෝගයට අදාළ අනෙකුත් වෛද්‍ය සහතික,දෙමාපිය/භාරකරුගේ ඉල්ලීම් ලිපිය, ශිෂ්‍යාගේ උප්පැන්න සහතිකයේ පිටපත,<br><br>හිමිකම් පත්‍රය , රෝග විනිශ්වය පත්‍රිකාව, ගෙවීම් කළ කුවිතාන්සි(අවසන් හා අත්තිකාරම්), විස්තරාත්මක බිල්පත්වල මුල් පිටපත්, මව/පියා/භාරකරුගේ බැංකු ගිණුම් විස්තර, අනෙකුත් අවශ්‍ය ලියවිලි, ශිෂ්‍යාගේ උප්පැන්න සහතිකයේ පිටපත |

## 3.4 බිල්පත් පියවීම

3.4.1 **සෘජු ගෙවීම් පහසුකම්-** අසාධ්‍ය රෝග සඳහා සහ අඩු ආදායම්ලාභීන් සඳහා පමණක් ඇස් කණ්නාඩි, කර්ණ උපකරණ ලබාගැනීම සඳහා.

### 3.4.2 බිල්පත් ප්‍රතිපූරණය කිරීම

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට හෝ ශාඛාවකට ඉල්ලුම් පත්‍රය ඇමුණුම 04 අනුව ඉදිරිපත් කර නිවැරදි බව සනාථ කර අවශ්‍ය ලිපි ලේඛන සමග ඉදිරිපත්කල විට කඩිනමින් ගෙවීම් කටයුතු සිදු කෙරේ.

## 3.5 ලියකියවිලි භාර දීම

- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ඕනෑම ශාඛා කාර්යාලයකට භාර දීම
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයට භාරදීම හෝ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යැවීම.

| |
|---|
| කළමනාකරු,<br>"සුරක්ෂා" රක්ෂණාවරණය,<br>13 වන මහල,<br>ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව<br>රක්ෂණ මන්දිරය, නො 21, වොක්ෂෝල් වීදිය,කොළඹ 02 |

## 4 වන පරිච්ඡේදය - විවිධ අධ්‍යාපන ආයතනවලින් අපේක්ෂිත කාර්යභාරය

### 4.1. අධ්‍යාපන අමාත්‍යාංශය -

වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් ගේ ප්‍රධානත්වයෙන් මෙහෙයුම් කමිටුවක් පත් කිරීම, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ද සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයින්ගෙන් ද සමන්විත වීම.

- පාසල් වාරයකට වරක් රැස්වීම් පැවැත්වීම හා වාර්තා ගොනුවක් නඩත්තු කිරීම.
- ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව හා අදාළ අනෙකුත් ආයතන සමඟ අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මගින් සම්බන්ධීකරණය සිදුවේ.
- මෙම කාර්යය සම්බන්ධයෙන් හදිසි ඇමතුම් අංකය ස්ථාපිත කිරීම, හදිසි ඇමතුම් අංකය ලෙස 011 278 7979 භාවිත වන අතර ගැටලු සහගත අවස්ථාවල දී හා තොරතුරු ලබා ගැනීම සඳහා පෙරවරු 8.30 සිට පස්වරු 4.15 කාලය ඇතුළත ඇමතීමෙන් තොරතුරු ලබා ගත හැකිය.
- ප්‍රජාව දැනුවත් කිරීම සහ පාසල් ප්‍රජාව සඳහා අවශ්‍ය මඟ පෙන්වීම.
- පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ, පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ, කලාප අධ්‍යාපන කාර්යාලවල සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල වැඩසටහන භාර නිලධාරීන් දැනුවත් කිරීම
- පාසල්වල සිසු තොරතුරු රක්ෂණ ආයතනයට ලබා දීම හා තොරතුරු යාවත්කාලීන කිරීම.

## 5 වන පරිච්ඡේදය - නියාමනය හා අධීක්ෂණය

නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය, නියාමනය සහ අධීක්ෂණයට අදාළව විවිධ ආයතන ක්‍රියාකළ යුතු ආකාරය, විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු, තොරතුරු ලබා ගැනීම යන විස්තර මෙම පරිච්ඡේදය තුළ අන්තර්ගත වේ.

### 5.1 නියාමනයේ දී අපේක්ෂිත කාර්යභාරය

- නිසි පරිදි සිසු තොරතුරු සැපයීම
- පාසලෙන් ඉවත් වන සිසු තොරතුරු නිසි වේලාවට සැපයීම
- ප්‍රතිලාභ ලබා ගැනීම් පිළිබඳ තොරතුරු පවත්වා ගෙන යාම
- නියමිත පරිදි කමිටු රැස්වීම් පැවැත්වීම
- රක්ෂණාවරණය ලබා ගැනීමට සහාය වීම හා මඟ පෙන්වීම

### 5.2 ආයතන ක්‍රියාකළ යුතු ආකාරය

#### 5.2.1 ජාතික මට්ටම

වැඩසටහන නියාමනය හා අධීක්ෂණය අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මඟින් ද සිදු කෙරේ. කිසියම් වරදක් හඳුනා ගත හොත් හෝ වංචාවක් සිදුවන බව අනාවරණය වුවහොත් ඒ පිළිබඳ ක්‍රියාකිරීමේ බලය මෙම ආයතන සතුවේ .

#### 5.2.2 පළාත් මට්ටම

පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔවුන් විසින් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදු කෙරේ.

#### 5.2.3 කලාප මට්ටම

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හා ඔහු විසින් බලය පවරන ලද නිලධාරීන්, කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මගින් රක්ෂණාවරණය ලබා ගැනීමට අදාළ සිද්ධි නියාමනය කෙරේ.

#### 5.2.4 පාසල් මට්ටම

විදුහල්පති හා විදුහල්පති විසින් බලය පවරන ගුරුභවතුන්/නිලධාරීන් මගින් රක්ෂණාවරණ ලබා ගැනීම හා ඒවා සම්බන්ධ කටයුතු නියාමනය කෙරේ.

## 5.3 විශේෂ අවධානයට යොමු විය යුතු කරුණු

- ගෙවීමක් සිදු කිරීමට පෙර අමතර ලියවිලි ඉල්ලා සිටීමට හෝ අදාළ හිමිකමේ හෝ ඉදිරිපත් කළ ලියවිලිවල නිරවද්‍යතාව තහවුරු කිරීමට අවශ්‍ය විමර්ශණ කටයුතු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සතු වේ.
- හිමිකම් නිරාවරණය වන්නේ වියදමට අදාළ ලියවිලිවල මුල් පිටපත් හෝ ඉල්ලා ඇති ආකාරයට ලියවිලි ඉදිරිපත් කළවිට පමණි.
- සාවද්‍ය හිමිකම් ඉල්ලීම හිමිකම් ප්‍රතික්ෂේප කිරීමට හේතු වන අතර තව දුරටත් ආවරණය අහෝසි කිරීමට හෝ වෙනත් සුදුසු දඬුවමකට යටත් වීමට හේතුවක් ලෙස සැලකේ.
- සියලු හිමිකම් බිල්පත් අදාළ දිනයේ සිට මාස 03ක් (දින 90 ) තුළ ඉදිරිපත් කළ යුතු අතර 2021/12/01 න් පසු රක්ෂණාවරණය අවසන් වී මාසයක් ඉකුත් වූ 2021/12/31 න් පසු

  ඉදිරිපත් කරන බිල්පත් ගෙවීම් සඳහා සලකා බලනු නොලැබේ.
- දිගු කාලීන ප්‍රතිකාරවල දී හැර බෙහෙත් වට්ටෝරුව නිකුත් කළ දින සිට දින 07ක් ඇතුළත ඖෂධ/පරීක්ෂණ ලබා ගත යුතු ය.
- සියලු ප්‍රතිකාර MBBS හෝ DAMS හෝ ඊට සමාන හා වැඩි සුදුසුකම් සහිත වෛද්‍යවරුන්

  ගෙන් ලබා ගත යුතු ය.
- ලියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කරන අවස්ථාවල නැවත ඒවා ලබා ගත යුතු නම් අදාළ මුල් පිටපත අනුව ඡායා පිටපතක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ ශාඛාවකින් සහතික කරවා ගෙන මුල් පිටපත නැවත ලබා ගත හැකි ය. එසේ වුව ද බිල්පත්/ ලදුපත් මුල් පිටපත් නැවත ලබා ගත නො හැකි ය.

## 5.4 තොරතුරු ලබා ගැනීම

- වැඩි විස්තර පහත වෙබ් අඩවිය මගින් ලබා ගත හැකි ය.
  - www.srilankainsuarane.com
  - www.moe.gov.lk

- දුරකථන අංක -
  - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 - 357 357 (24 පැය ඇමතුම් සේවාව)
  - ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව - 0112 - 319015 ( සතියේ දිනවල කාර්යාල වේලාව තුළ පෙ.ව. 8.30 ප.ව.4.45)
  - අධ්‍යාපන අමාත්‍යාංශය - 0112 - 787 979